# සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

# (රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්))

# සඳහා වන

# බඳවා ගැනීමේ පරිපාටිය.

# (MT - 8 - 2006 A)

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
**No. 177, Nawala Road, Narahenpita, Colombo 05.**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/3/1/13/1/2013
ඔබේ අංකය / உமது இல. / Your No.: 06/C/32/2009
දිනය / திகதி / Date: 2014.05.29

(943)

04 JUN 2014

465
03 JUN 2014
Deputy Director General (Admin.)

DDG(A) I
30 MAY 2014
MINISTRY OF HEALTH

DA06

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.

<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන MT -08 බඳවා ගැනීමේ පරිපාටිය.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2014.05.13 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවාගැනීම් පරිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

බී.එම්.බී.එම්.ජේ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

<u>පිටපත්</u> : 01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)

02. ආයතන අධ්‍යක්ෂ ජනරාල්- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (මුල් පිටපත මේ සමග එවමි)

(682)


දුරකථන / தொலைபேசி இல. / Telephones } 011-2136600 011-2136650 011-2136700

ලේකම් / செயலாளர் / Secretary } 011-2136602

ෆැක්ස් / தொலை நகல் / Fax } 011-2369305 011-2369302

විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail } info@psc.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No. } PSC/EST/3/1/13/1/20

ඔබේ අංකය / உமது இல. / Your No. } 06/C/32/2009

දිනය / திகதி / Date } 2014.04.22

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන MT 08 බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීම.</u>**

උක්ත කරුණට අදාළව එවා ඇති ඔබේ සමාංක හා 2014-01-30 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ඇමුණුමේ සඳහන් සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2014/04/17 දින අනුමත කර ඇති අතර, එම සංශෝධන අනුව සකස් කල ඉහත බඳවා ගැනීම් පරිපාටියේ මුල් පිටපත් 05 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

බී.එම්.බී.එම්.ඒ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 1) ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව.
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

සංශෝධන ලැයිස්තුව

<table>
<tr><th>අනු අංකය</th><th>විෂය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>1.</td><td>1.2</td><td>අමාත්‍යාංශය : සෞඛ්‍ය යොමු අංකය : 06/C/32/2009 දිනය : 2014.01.30</td></tr>
<tr><td>2.</td><td>7.1</td><td>බඳවා ගන්නා ප්‍රතිශතයන්<br>
<table>
<tr><th>ධාරාව</th><th>ප්‍රතිශතය</th></tr>
<tr><td>විවෘත</td><td>-</td></tr>
<tr><td>සීමිත</td><td>50%</td></tr>
<tr><td>කුසලතා</td><td>50%</td></tr>
</table>
සටහන : කුසලතා බඳවා ගැනීම සඳහා වෙන් කෙරෙන පුරප්පාඩු වලින් 50% ක් I ශ්‍රේණියේ වෛද්‍ය සැපයුම් සහකාරවරුන් අතරින්ද, 50% ක් I ශ්‍රේණියේ ඖෂධවේදීන් අතරින්ද, බඳවා ගැනීම සිදු කරනු ලැබේ.<br><br>(ඒ අනුව පවතින සටහන් I, II, III ඉවත් කරන්න.)</td></tr>
<tr><td>3.</td><td>7.3.2.3</td><td>පළපුරුද්ද : MT 04, MT 05, MT 06 යන වැටුප් කේත යටතේ වැටුප් ලබන අමාත්‍යාංශගත තනතුරක වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම</td></tr>
<tr><td>4.</td><td>7.3.3</td><td>වයස : අදාළ නොවේ<br>(7.3.3.1 හා 7.3.3.2 සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය)</td></tr>
<tr><td>5.</td><td>7.4.2.3</td><td>පළපුරුද්ද : සෞඛ්‍ය අමාත්‍යාංශයේ 1 වන ශ්‍රේණියේ වෛද්‍ය සැපයීම් සහකාරවරයෙකු වීම හෝ 1 වන ශ්‍රේණියේ ඖෂධවේදියෙකු වීම.</td></tr>
<tr><td>6.</td><td>7.4.3</td><td>වයස : අදාළ නොවේ<br>(7.4.3.1 හා 7.4.3.2 සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය)</td></tr>
<tr><td>7.</td><td>7.4.4</td><td>බඳවා ගැනීමේ ක්‍රමය : අදාළ නොවේ<br>(7.4.4.1, 7.4.4.2 හා 7.4.4.3 සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය)</td></tr>
<tr><td>8.</td><td>7.4.5</td><td>අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්.</td></tr>
<tr><td>9.</td><td>09</td><td>භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ<br>ඒ යටතේ ඇති වගුව සම්පූර්නයෙන්ම ඉවත් විය යුතුය.</td></tr>
<tr><td>10.</td><td>13</td><td>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :<br>"සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය</td></tr>
<tr><td>11.</td><td>14</td><td>ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ<br>සඳහන්ව ඇති වාක්‍යය සම්පූර්ණයෙන්ම ඉවත් විය යුතුය</td></tr>
</table>

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය (MT-8-2006(ඒ))

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය යොමු අංකය : . 06/C/32/2009 දිනය: 2014.01.30

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : යොමු අංකය : DMS/C/08/45 දිනය: 2012.05.10

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය : ආ/ 3/4/2/340-179 දිනය : 2012.08.02

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය : NSCC/4/13/SR-21 දිනය : 2012.12.21

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : යොමු අංකය : PSC/EST/3/1/13/1/2013 දිනය :2014.04.17

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : විශේෂ ශ්‍රේණිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයීම් අංශයේ අධ්‍යක්ෂ වෙත පැවරෙන සමස්ත කාර්යය භාරයේ අන්තර්ගත කාර්යයන් අතර කොටසක් වශයෙන් ගිණිය හැක්කා වූද කාර්යයන් පැවරෙන සේවා ගණයක්.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය** : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MT 08 -2006 ඒ

5.2 වැටුප් පරිමාණය : රු.24,180-10 x 650 -8 x 790 -37,000/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය ( රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | රු.24,180 |

06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 01. | සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) | විශේෂ ශ්‍රේණිය | 08 | *වෛද්‍ය සැපයීම් අංශයේ වෛද්‍ය සැපයීම් සහකාරවරුන් හා ඖෂධවේදීන් අධීක්ෂණය කිරීම<br>* සේවක පරිපාලනය, ගබඩා පරිපාලනය.<br>* ඖෂධ, වෛද්‍ය උපකරණ ,විකිරණ ද්‍රව්‍ය, විවිධ ද්‍රව්‍ය හා රසායනාගාර අයිතමවල පිරිවිතර සංවර්ධනය , වට්ටෝරු සමාලෝචනය, තත්ව ආරක්ෂණය, ඇස්තමේන්තු කිරීම, ඇණවුම් කිරීම, ගබඩාකරණය, තොග පාලනය, බෙදා හැරීම ,ප්‍රවාහනය හා වාප්පු ආදී කටයුතු අධීක්ෂණය හා කළමනාකරණය යනාදී රාජකාරීන්.<br>* ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| 02. | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) | විශේෂ ශ්‍රේණිය | 01 | * වෛද්‍ය සැපයීම් කළමනාකරණය ,සැපයුම් සහයක සේවා කලමනාකාරණය සහ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ තාක්ෂණික හා අනෙකුත් කාර්යයන්හිදී සහකාර අධ්‍යක්ෂවරුන් අධීක්ෂනය කිරීම.<br>* ප්‍රධාන ඔිපියම් නිලධාරි වෙත අන්තරායකාරී ඖෂධ පාලනය සම්බන්ධ පැවරී ඇති වගකීම් / රාජකාරි ඉටු කිරීම , සැලසුම්කරණය , මානව සම්පත් හා ඝරිතල පහසුකම් සංවර්ධනය සහ පරිපාලන කටයුතු වලදී වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂවරයාට සහාය දීම.<br>* ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) 08
ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) 01

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 50% |
| කුසලතා | 50% |

සටහන:

කුසලතා බඳවා ගැනීම සඳහා වෙන් කෙරෙන පුරප්පාඩු වලින් 50% ක් I ශ්‍රේණියේ වෛද්‍ය සැපයීම් සහකාරවරුන් අතරින් ද , 50% ක් I ශ්‍රේණියේ ඖෂධවේදීන් අතරින් ද, බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**7.2 විවෘත බඳවා ගැනීම** : අදාළ නොවේ.

**7.3 සීමිත බඳවා ගැනීම්**

7.3.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : විශේෂ ශ්‍රේණිය

7:3:2 **සුදුසුකම් :**

7.3.2.1 **අධ්‍යාපන සුදුසුකම් :**

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඖෂධවේදී විශේෂ උපාධියක් (B.Pharm.) / (B.Sc.Pharmacy) හෝ වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් (B.Sc.M.L.S.)

හෝ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ඖෂධවේදය , වෛද්‍ය රසායනාගාර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක හෝ භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංඛ්‍යානය , ජීව විද්‍යාව යන විෂයයක් ඇතුලත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක ප්‍රථම හෝ දෙවන පෙළ සාමාර්ථයක්

හෝ

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව,භෞතික විද්‍යාව, සංඛ්‍යානය , ජීව විද්‍යාව , ඖෂධවේදය යන විෂයක් ඇතුලත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ එම විෂයයක හෝ කළමනාකරණ විෂයක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

හෝ

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක රසායන විද්‍යාව,භෞතික විද්‍යාව, සංඛ්‍යානය , ජීව විද්‍යාව , වෛද්‍ය රසායනාගාර විද්‍යාව , ඖෂධවේදය යන විෂයයක් ඇතුලත් විද්‍යාවේදී (B.Sc.) සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් සමඟ රජයේ /රජයට අනුබද්ධ ආයතනයක ඖෂධවේදය, වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදය හෝ සැපයුම් / මිලදී ගැනීම් හා භාණ්ඩ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්

7.3.2.2 **වෘත්තීය සුදුසුකම්** : අදාල නොවේ

7.3.2.3 පළපුරුද්ද : MT 04, MT 05, MT 06 යන වැටුප් කේත යටතේ වැටුප් ලබන අමාත්‍යාංශගත තනතුරක වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.4 **කායික සුදුසුකම්** : අදාළ නොවේ.

7.3.2.5 වෙනත් :

i. සේවයේ ස්ථිර කර තිබීම.

ii. පූර්වාසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3.3 වයස : අදාල නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2.විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100 | 40% |

සටහන : ලිඛිත විභාගය පිළිබඳ විස්තර ඇමුණුම -01 ඇත.

7.3.4.1.1 **පවත්වන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

7.3.4.2 **වෘත්තීය පරීක්ෂණය** : අදාළ නොවේ.

7.3.3.4 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු** : අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් පරීක්ෂා කිරීම

7:3:3:4:1 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරනු ලබන බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.3 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය** : අදාළ නොවේ.

7.3.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛ මගින්

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : විශේෂ ශ්‍රේණිය

7.4.2 **සුදුසුකම් :**

7.4.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : අදාළ නොවේ.

7.4.2.2 **වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ.

7.4.2.3 **පළපුරුද්ද** : සෞඛ්‍ය අමාත්‍යාංශයේ I වන ශ්‍රේණියේ වෛද්‍ය සැපයීම් සහකාරවරයකු වීම හෝ I වන ශ්‍රේණියේ ඖෂධවේදියකු වීම.

7.4.2.4 **කායික සුදුසුකම්** : අදාළ නොවේ.

7.4.2.5 **වෙනත්** :

i. සේවයේ ස්ථිර කර තිබීම.
ii. පූර්වාසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කල යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 **වයස** : අදාළ නොවේ.

7.4.4 **බඳවා ගැනීමේ ක්‍රමය**

7.4.4.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

සටහන: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර - **ඇමුණුම 02** හි ඇත.

7.4.4.1.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය** : අමාත්‍යාංශයේ පොදු චක්‍රලේඛයක් මගින් හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

**08. කාර්යක්ෂමතා කඩඉම්** : අදාළ නොවේ.

**09. භාෂා ප්‍රවීණතාවය** : අදාළ නොවේ.

**10. ශ්‍රේණි උසස් කිරීම** : අදාළ නොවේ

## 11. තනතුරුවලට පත් කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) | i. සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරේ වසර 05ක පළපුරුද්දක් සහිත නිලධාරියෙකු වීම. |

11.2 **තෝරා ගනු ලබන ක්‍රමය :** ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) වරුන්ගෙන් ජ්‍යෙෂ්ඨතම නිලධාරියා පත් කරනු ලැබේ.

**12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :** අදාල නොවේ.

**13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:**

**"සක්‍රිය සේවා කාලය"** යනු : ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:** අදාල නොවේ.

15. සැම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ අත්සන : ........................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ර්.සෝමරත්න
තනතුර : වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014/05/06

පරීක්ෂා කළේ අත්සන : ........................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.ඩී.සී.විමලසිරි
තනතුර : වැ.බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.05.06

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම :වෛද්‍ය පී.ජී.මහිපාල
තනතුර : සෞඛ්‍ය සේවා සේවා අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව : ........................

දිනය : 2014.05.08

යොමු අංකය : 06/C/32/2009

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ........................
නම : වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය : 13/05/014

නිල මුද්‍රාව : ........................

යොමු අංකය : PSC/EST/3/1/13/1/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) හා ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2014.04.17 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ........................
නම : ........................
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014 05 28

නිල මුද්‍රාව: ........................



ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

# ඇමුණුම - 01

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හි

රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්)

තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය (MT-8-2006(ඒ))

01. **විභාගයේ නම** : සීමිත බඳවා ගැනීමේ ලිඛිත පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | පැය 01යි | 100 | 40% |
| 2.විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | පැය 02යි | 100 | 40% |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : තනතුරු වල පුරප්පාඩු ඇති වීම මත

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිතය හා භාෂා හැකියාව මැන බැලීම |
| 2.විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | I. වෛද්‍ය සැපයීම් කළමණාකරණයට විශේෂ අවධානය සහිතව කළමණාකරණ හා සංවිධාන පිළිබඳව<br>II. ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශවල වෛද්‍ය සැපයීම් ක්ෂේත්‍රය හා සෞඛ්‍ය සේවාවේ ප්‍රධාන අංශ (නිවාරණ හා ප්‍රතිකාර) පිළිබඳව<br>III. මූලික කළමණාකරණ හා සංවිධාන මූලධර්ම හා සම්බන්ධ සිද්ධි අධ්‍යයනය |

සටහන:

අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් ඉහත විභාගයට භාජනය කර ඉන් එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%කට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රශ්න පත්‍ර දෙකෙහිම ලකුණු වල එකතුවේ ප්‍රමුඛතා ලේඛනයක් සකසා පවතින පුරප්පාඩු අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවීම කරනු ලැබේ.

සකස් කළේ අත්සන : H.A.I. Semeda...........
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ./බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014/05/06

පරීක්ෂා කළේ අත්සන : .................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.බී.සී.විමලසිරි
තනතුර : වැ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.05.06

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : .........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහිපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014.05.08
නිලමුද්‍රාව : .........................................

## ඇමුණුම - 02

සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි

රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ සහකාර අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්)

තනතුරට සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය (MT-8-2006(ඒ))

01. **සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණ :** කුසලතා මත බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. **ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර** :

| | පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| i | අධ්‍යාපන සුදුසුකම් | 15 |
| ii. | අදාළ ශ්‍රේණියේ පළපුරුද්ද | 50 |
| iii. | අදාළ ක්ෂේත්‍රයේ අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 |
| iv. | පරිගණක හැකියාව | 10 |
| v. | සම්මුඛ පරීක්ෂණයේදි දක්වනු ලබන කුසලතාවය | 05 |
| | එකතුව | 100 |

සකස් කළේ අත්සන : H.A.I. [signature]
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වෛ./බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014/05/06

පරීක්ෂා කළේ අත්සන : [signature]
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ඊ.ඩී.සී.විමලසිරි
තනතුර : වෛ./බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.05.06

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2014.05.08
නිලමුද්‍රාව :